

## රජය සතු විශාලතම අලෙවිසැල් ජාලය සඳහා

# කළමනාකරු - තොරතුරු තාක්ෂණ (MM 1-1)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

(01) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ තොරතුරු තාක්ෂණය/ පරිගණක විද්‍යාව/ තොරතුරු පද්ධති කළමනාකරණය (MIS) විෂය පිළිබඳ ප්‍රථම උපාධියක්,

සමග

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක වසරක පශ්චාත් සුදුසුකම් සේවා පළපුරුද්ද

(02) තොරතුරු තාක්ෂණ විෂය පිළිබඳව, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 7 (NVQ Level 7) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සමග

සහතිකය ලබාගැනීමෙන් පසුව, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක වසරක පශ්චාත් සුදුසුකම් සේවා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

(01) ඉහත දැක්වෙන බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

(02) තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ සහකාර කළමනාකරණ (JM) මට්ටමේ තනතුරක වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.)

**වැටුප් හා අනෙකුත් දීමනා :** MM 1-1 Rs. [53,175 – 10 x 1375 – 15 x 1,910 – 95,575]
මූලික වැටුප : රු. 53,175/- (මීට අමතරව තනතුරට අදාලව රජය විසින් අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.)
(ප්‍රවාහන දීමනාව රු.12,500/- + ජංගම දුරකථන ප්‍රතිපූර්ණය රු.3,000/- (මාසික) මෙම තනතුර සඳහා හිමිය)

**පත්වීමේ ස්වභාවය:** ස්ථිර

**සුදුසු අයදුම්කරු සතුව,**

- ERP පද්ධති, සංකල්ප සහ ක්‍රමවේදයන් සමග කටයුතු කර පළපුරුද්ද තිබිය යුතුය.
- ජාල ආරක්ෂණ විසඳුම්, ෆයර්වෝල් සහ ප්‍රති-වයිරස මෘදුකාංග ස්ථාපනය කිරීම, පරිපාලනය කිරීම සහ දෝශ නිරාකරණය කිරීම පිළිබඳ පළපුරුද්ද සහ දත්ත, ජාල ප්‍රවේශය සහ උපස්ථ පද්ධතිවල ආරක්ෂාව සහතික කිරීම පිළිබඳ අත්දැකීම් තිබිය යුතුය.
- පද්ධති නඩත්තුව හා වැඩිදියුණු කිරීම සහ පවත්නා පද්ධති සමග නව පද්ධති ඒකාබද්ධ කිරීම පිළිබඳ අත්දැකීම් තිබිය යුතුය.
- නවතම ආරක්ෂණ හිදැස් වලට අදාලව මෘදුකාංග යාවත්කාලීන කිරීම සහ ජාලයන්හි තිබි ආරක්ෂාව සහතික කිරීම පිළිබඳ අත්දැකීම් තිබිය යුතුය.
- විශිෂ්ඨ විශ්ලේෂණ, ගැටළු විසඳීමේ සහ සංවිධාන කිරීමේ හැකියාවන් සමග දත්ත ඇගයීමේ, සමාලෝචන කිරීමේ හා අර්ථ නිරූපනය කිරීමේ හැකියාවන් තිබිය යුතු අතර, ඉහළ ස්වයං අභිප්‍රේරිත පුද්ගලයෙකු විය යුතුය.
- ප්‍රබල නායකත්ව ගුණාංග සහ අන්තර් පුද්ගල සන්නිවේදන කුසලතා තිබිය යුතුය.
- විවිධ කණ්ඩායම් වලට නායකත්වය ලබාදීමේ සහ මෙහෙයවීමේ සහාය කළ හැකියාව තිබිය යුතුය. මානව සහ අනෙකුත් සම්පත් නිසිලෙස යෙදවීමේ සහ සාර්ථකව කළමනාකරණය කිරීමේ පළපුරුද්ද තිබිය යුතුය.

**සෑම අයදුම්කරුවෙකුම,**

I. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

II. තනතුරේ කාර්යභාරය හොඳින් ඉටුකිරීම සඳහා සහ ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය ශාරීරික හා මානසික යෝග්‍යතාවය තිබිය යුතුය.

III. විශිෂ්ඨ පෞරුෂයකින් හෙබි අයෙකු විය යුතුය.

ඔබට නියම සුදුසුකම් හා පළපුරුද්ද ඇතිනම්, ඔබගේ ජීවදත්ත ලේඛනය, සහතික වල ඡායා පිටපත් සමග මෙම දැන්වීම පළවී දින 14 ක් ඇතුලත ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කරන්න. නැතිනම් vacancies@lankasathosa.org යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කරන්න (ඉල්ලුම් කරනු ලබන තනතුර ලිපි කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි / විද්‍යුත් තැපැල් පණිවුඩයෙහි "subject" තීරුවෙහි සඳහන් කල යුතුය).

(කෙටි ලැයිස්තුගත කළ අපේක්ෂකයන්ට පමණක් ආයතනය විසින් ප්‍රතිචාර දක්වනු ලැබේ.)


වෙළඳ අමාත්‍යංශය

සභාපති,
ලංකා සතොස ලිමිටඩ්,
සතොස මහලේකම් ගොඩනැගිල්ල,
අංක 27, 05 වන මහළ,චොක්ෂෝල් වීදිය, කොළඹ 02

ලංකා සතොස
LANKA SATHOSA